සියලුම හිමිකම් ඇවිරිණි.

ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## අනාවරණ පරීක්ෂණය - 2020

## ගණිතය

## 6 ශ්‍රේණිය

කාලය : පැය 02

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

නම : ………………………………………….. පන්තිය :…………… විභාග අංකය :……………

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම අදාළ පිළිතුර කොටුව තුල ලියන්න.**

## I - කොටස

(1) වෘත්තාකාර හැඩය ඇඳීම සඳහා භාවිතා කළ හැකි ද්‍රව්‍ය 2 ක් නම් කරන්න.

(i) …………………………………………..

(ii) …………………………………………..

(2) සුළු කරන්න.

(i) $352 + 463$ = ………………………

(ii) $200 - 64$ = ………………………

(3) දොඩම් ගෙඩි 5 ක මිල රු. 100 කි. දොඩම් ගෙඩි 8 ක මිල සොයන්න.

…………………………………………………….


(4) 8 හි සාධක මොනවා ද ?

…………………………………………..


(5) රූපයේ දැක්වෙන

(i) සෘජුකෝණයක් නම් කරන්න. ……………..

(ii) මහා කෝණයක් නම් කරන්න. ……………..





(6) පහත රූපයේ ඇති සරල රේඛීය තල රූපවල නම් ලියන්න.




(i) P = …………………

(ii) q = …………………..

(7)




(i) ඉහත සංඛ්‍යා රේඛාවේ M මගින් නිරූපිත සංඛ්‍යාව කීයද ? …………………………

(ii) M හා N යන සංඛ්‍යා දෙකෙන් විශාල සංඛ්‍යාව කුමක් ද ? ………………………

(8) බස් රථයක සිටින මගීන් ගණන ආසන්න දහයට වටැයූ විට ලැබුණු අගය 30 කි. ඉන් මගියෙක් බැස ගිය පසු ඉතිරි වූ මගීන් ගණන ආසන්න දහයට වටැයූ විට ලැබුණු අගය 20 ක් නම් බස් රථයේ මුලින් ම සිටි මගීන් ගණන කීයද ?


…………………………………………………………

(9) $\frac{3}{10}$ සඳහා තුල්‍ය භාග 2 ක් ලියන්න.

(10) ' දහ අට දහස් හත්සිය පනහ ' ඉලක්කමෙන් ලියන්න.

…………………………………………..

(11) රූපයේ පරිමිතිය සොයන්න.




............................................

(12) පහත ප්‍රකාශන මගින් දැක්වෙන්නේ ඥාතයක් ද අඥාතයක් ද යන්න සඳහන් කරන්න.

(i) ත්‍රිකෝණයක ඇති පද ගණන - ............

(ii) පොතක ඇති පිටු ගණන - ...........

(13) > හෝ < අසමානතා ලකුණ ගැළපෙන පරිදි හිස්තැන් වල යොදන්න.

(i) $\frac{1}{5}$ ......... $\frac{1}{10}$


(ii) $\frac{56}{100}$ ....... $\frac{6}{10}$

(14) $x = 8$ වන විට පහත ප්‍රකාශන වල අගය සොයන්න.

(i) $x + 5$ = ..........................

(ii) $12 – x$ = ..........................

(15) 4062 ගණක රාමුවක නිරූපනය කරන්න.



(16) මාලා පාසලට යාමට නිවසින් පිටත් වන්නේ පෙ.ව. 6.30 ට ය. පාසලට යාමට ඇයට මිනිත්තු 35 ක් ගත වේ නම් ඇය පාසලට ළඟා වූ වේලාව සම්මත ආකාරයෙන් ලියන්න.

..........................................

(17) පහත වේලාවන් පැය 12 ඔරලෝසු වේලාවෙන් ලියන්න.

(i) 05 : 30 = ..............................

(ii) 18 : 40 = .............................

(18) හිස්තැන් පුරවන්න.

තත්පර 135 = මිනිත්තු ........ තත්පර .......

(19) 0.5 , 0.55 , 0.05 යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

..........................................

(20) 6243 සංඛ්‍යාවේ 2 න් නිරූපණය වන අගය කුමක් ද?

..........................................

( ලකුණු 2 x 20 = 40 )

## II – කොටස

- **සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නිවැරදි ලෙස ප්‍රශ්න අංකය සඳහන් කර වෙන ම පිළිතුරු පත්‍රයක ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් ලැබේ.**

(1) (a) පහත දැක්වෙන එක් එක් අවස්ථාවේ සඳහන් වන ද්‍රව ප්‍රමාණ ප්‍රකාශ කිරීමට වඩාත් සුදුසු මිනුම් ඒකකය <u>**ලීටර**</u> ද <u>**මිලිලීටර**</u> ද යන්න සඳහන් කරන්න.

(i) අත්ලට අල්ලන ද්‍රව ප්‍රමාණය ……………………………………………


(ii) වතුර ටැංකියකට අල්ලන ද්‍රව ප්‍රමාණය ……………………………………………

(iii) වාහනයකට යොදන ඉන්ධන ප්‍රමාණය ……………………………………………


(iv) ළදරුවෙකුට වරකට දෙනු ලබන කිරි ප්‍රමාණය ……………………………………………

(ලකුණු 02)

(b)



(A)



(B)

(i) A හා B භාජන දෙකේ ඇති මුළු ද්‍රව ප්‍රමාණය කොපමණ ද ?

……………………………………..

(ii) A භාජනයේ ඇති ද්‍රව ප්‍රමාණය B භාජනයට වඩා කොපමණ වැඩි ද ?

……………………………………..

(ලකුණු 04)

(c) 6 ශ්‍රේණියේ පංතියක ළමුන් පිරිසක් පළතුරු බීම සෑදීම සඳහා මිශ්‍ර පළතුරු යුෂ ලීටර 3 ක් හා දෙහි යුෂ 750 ml ක් ගෙන එන ලදි.

(i) රැගෙන එන ලද මිශ්‍ර පළතුරු යුෂ ප්‍රමාණය මිලි ලීටර කීයද ? (ලකුණු 01)

……………………………………………………………………………………………

(ii) මිශ්‍ර පළතුරු යුෂ හා දෙහි යුෂ මිශ්‍ර කර ඊට ජලය ලීටර 6 ක් ද එකතු කර පළතුරු බීම සාදන ලද නම් සාදා ගත් බීම ප්‍රමාණය ලිටර හා මිලි ලීටර වලින් ලියන්න. (ලකුණු 03)

……………………………………………………………………………………………

(iii) එක් ළමයෙකුට බීම 250 ml බැගින් ලැබෙන සේ සාදා ගත් බීම ප්‍රමාණය බෙදා දිය හැකි ළමුන් ගණන කීයද ? (ලකුණු 02)

……………………………………………………………………………………………

(iv) බීම මිශ්‍රණයේ ඇති මිශ්‍ර පළතුරු යුෂ හා දෙහි යුෂ අතර අනුපාතය සරල ම ආකාරයෙන් ලියා දක්වන්න. (ලකුණු 02)

……………………………………………………………………………………………

(2) (a) කිලෝග්‍රෑමයකට ඇති ග්‍රෑම් ගණන කීය ද ? (ලකුණු 01)

……………………………………………………………………………………………

(b) පහත වගුවේ හිස්තැන් පුරවන්න. (ලකුණු 03)

| g | kg | g |
|---|---|---|
| 1 650 | (i) ………. | 650 |
| 3 078 | (ii) ………. | (iii) ………. |
| 680 | (iv) ………. | (v) ………. |
| (vi) ………. | 2 | 420 |

(c) වෙළෙන්දෙක් එක් දිනක දී විකුණන ලද ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

| **ද්‍රව්‍ය** | **විකිණූ ප්‍රමාණය** | **1 kg ක විකුණුම් මිල** |
|---|---|---|
| සහල් | 20 kg | රු. 110 |
| අල | 6 kg 500 g | රු. 130 |
| සුදු ලූණු | 5 kg | රු. 200 |

(i) විකුණන ලද සුදු ළූණු ප්‍රමාණය ග්‍රෑම් කීයද ? (ලකුණු 01)

……………………………………………………………………………………………………

(ii) විකුණන ලද සියලුම ද්‍රව්‍ය වල ස්කන්ධය කොපමණ ද ? (ලකුණු 02)

……………………………………………………………………………………………………

(iii) සියළුම ද්‍රව්‍ය විකිණීමෙන් එදින වෙළෙන්දා ලැබූ මුළු මුදල සොයන්න. (ලකුණු 05)

……………………………………………………………………………………………………

(3) සුළු කරන්න.

(i) 45 x 0 = ……………

(ii) 29 500 ÷ 10 = ……………

(iii) 82 x 10 = ……………..

(iv) 396 ÷ 4 = ……………..

(v) 0 ÷ 63 = …………….

(vi) 56 x 8 = …………….

(vii) 2 . 4 + 3 . 8 = …………….

(viii) 25 . 56 – 15 . 83 = ……………

(ix) 39 ÷ 3 = ……………..

(4) (a) (i) සංවෘත රූපයක් අඳින්න.

(ii) විවෘත රූපයක් අඳින්න.

(iii) සරල රේඛීය තල රූපයක් අඳින්න.

(iv) ඍජුකෝණාස්‍රයක හා සමචතුරස්‍රයක දැකිය හැකි සමානකම් 2 ක් ලියන්න. (ලකුණු 05)

………………………………………………………………………………………

………………………………………………………………………………………

(b) පහත දී ඇති ද්‍රව්‍ය කාණ්ඩ 2 කට වෙන් කර එක් එක් කාණ්ඩය සඳහා සුදුසු නමක් බැගින් ලියන්න.

පෑන , කලිසම , මකනය , පැන්සල , කමිසය , පොත , බැනියම , සරම (ලකුණු 04)

.......................................................................................................

.......................................................................................................

(c) (i) 1 ත් 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා ලියා දක්වන්න. (ලකුණු 02)

.......................................................................................................

(ii) කුඩා ම සංයුක්ත සංඛ්‍යාව කුමක් ද? (ලකුණු 01)

.......................................................................................................

(5) (a)

| 2495300 |
|---|

(i) ඉහත කොටුව තුල ඇති සංඛ්‍යාව කලාපවලට වෙන් කර ලියන්න.

.......................................................................................................

(ii) එම සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.

.......................................................................................................

(ලකුණු 03)

(b) (i) හරය 7 වූ තත්‍ය භාග 2 ක් ලියන්න.

.......................................................................................................

(ii) $\frac{6}{24}$ ට සරල ම තුල්‍ය භාගය ලියන්න.

.......................................................................................................

(ලකුණු 03)

(c) සුළු කරන්න.

(i) $\frac{3}{7} + \frac{2}{7}$ (ii) $\frac{5}{11} - \frac{2}{11}$ (iii) $\frac{1}{4} + \frac{3}{8}$ (iv) $\frac{5}{6} + \frac{2}{3}$ (ලකුණු 06)